සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 1 ශ්‍රේණිය - පරිසරය (අගෝස්තු -3 සතිය )

## 11 - තේමාව - අපට ඕනෑ දේ ලැබෙන හැටි

දෙමව්පියනි,

පහත දී ඇති ද්‍රව්‍ය සපයා ගන්න.

- එදිනෙදා පරිහරණය කරන විවිධ භාණ්ඩවල, ද්‍රව්‍යවල ලේබල් හා පින්තූර
  උදා:- සබන්, දත්බෙහෙත්, කුළු බඩු,ආහාරපාන වැනි.....
- කාඩ්බෝඩ් පෙට්ටි දෙකක් ගෙන එකක රතුපාට රවුමක් හා අනෙක් පෙට්ටියේ කොළපාට රවුමක් අලවා සකස් කරගන්න.

ඔබ දරුවා සමඟ මෙවැනි සංවාදයක යෙදෙන්න.

- අපේ ගෙදරට කඩෙන් එහෙමත් නැතිනම් වෙළඳපොළෙන් ගෙනෙන දේවල් මොනවාද?
- අපේ ගෙවත්තෙන් අපි ලබා ගන්නා දේවල් මොනවාද?

1.දැන් ඔබ කලින් සූදානම් කරගත් පින්තූර හා ලේබල් එකට මිශ්‍ර කරන්න.

2.සකස් කරගත් කාඩ්බෝඩ් පෙට්ටි දෙකද දරුවා අසලින් තබන්න.

3.දරුවාගේ අභිමතය පරිදි කඩෙන් ගෙනෙන දේවල් රතු පැහැති පෙට්ටියටත්, ගෙවත්තෙන් ලබා ගන්නා දේවල් කොළ පැහැති පෙට්ටියටත් දමන ලෙස පවසන්න.

4.දරුවා තේරූ ආකාරය නිවැරදි දැයි බලන්න.

පුංචි දුවේ පුතේ, දැන් ඔයා දැනගත්තා නේද අපි කඩෙන් ගෙනෙන දේවල් මොනවද? ගෙවත්තෙන් ලබාගන්න දේවල් මොනවාද කියලා?

එහෙමනම් පහත දීලා තියෙන කොටුවල ඔයාට පුළුවනි, කඩෙන් ගෙනෙන දේවල් හා ගෙවත්තෙන් ලබා ගන්නා දේවල් කිහිපයක් චිත්‍රයට නඟන්න.



E nanapiyasa 1 ශ්‍රේණිය පරිසරය -11 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.